# කතා කරන පුංචි මගේ යාළු ඔරලෝසුව



සවෙත්මි යුහන්සා අමුණුගම

# කතා කරන පුංචි මගේ යාළු ඔරලෝසුව

සවෙත්මි යුහන්සා අමුණුගම

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත් ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරිම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.
මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.


ශෂිකලා සේනාධීර,
විදුහල්පතිණිය,
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

ඔන්න එකමත් එක කාලෙක ගමක් තිබුණා. ඒකේ තිබුණා ලස්සන ලස්සන ඔරලෝසු පිරිච්ච ලස්සන කඩයක්.

ඒ කඩේ විවිධ හැඩයේ රවුම්, හතරැස්, කොටු විවිධාකාර ඔරලෝසු තිබුණා මිනිස්සුන්ට විකුණන්න. ඒ කඩේ ඔරලෝසු හැමදාම බලාගෙන හිටියේ තමන්ව කවුරුහරි ගෙදර ගෙනියනකම්.



නමුත් එක ඔරලෝසුවක් තිබුණා එයා කොහෙවත් යන්න අකමැතියි. එකම තැනකට වෙලා ඉන්න කැමති කම්මැලි ඔරලෝසුවක්.



එක දවසක් පුංචි ළමයෙක් වන රාමු තම පියත් එක්ක එම ඔරලෝසු කඩයට ගියේ ඔරලෝසුවක් තෝරා ගන්න.

ඔරලෝසු රාමු දැක්ක ගමන් “මාව ගන්න, අනේ මාව ගන්න“ කියලා හයියෙන් කෑගැහුවා. ඔක්කොම ඔරලෝසු දෙස බැලූ පුංචි රාමු අර කම්මැලි සීනු ඔරලෝසුව ගාව නතර වුණා.

සීනු ඔරලෝසුව ගල් වෙලා වගේ හිටියා. මේක දැකපු අනිත් ඔරලෝසු ටික රාමුට කිව්වේ “ඔය ඔරලෝසුව නම් ගන්න එපා, පුංචි යාළුවේ ඔය ඔරලෝසුව නම් හරිම කම්මැලි හරියට වැඩක් කරන්නේ නෑ“ කියලා.



නමුත් පුංචි රාමු මේ ඔරලෝසුවට ආස වුණා. අනිත් අය කියන දේවල් අහන්නේ නැතිව තම පියාට කියා ඒ ඔරලෝසුව මිලදී ගෙන ගෙදර ගියා.

ගෙදර ගෙනා සීනු ඔරලෝසුව රාමු තමන්ගේ කාමරය ඇතුළේ තියෙන ඇඳ ළඟ මේසය උඩ තිබ්බා. හැමදාම ඔරලෝසුවේ කුණු, දූවිලි පිරිසුදු කර පරිස්සමින් බලා ගත්තා.



ඉතින් එක දවසක් රාමු ඔරලෝසුවේ වේලාව උදේ 7.00 ට සීනුව තබා නින්දට ගියා. රාමුට නින්ද ගිය පසු සීනු ඔරලෝසුව උදේ 7.00 තිබූ සීනුව වෙනස් කර උදේ 8.00 ට සැකසුවා.

උදේ සීනුව නාද වුණේ උදේ 8.00 වහා අවදි වී කලබල වූ රාමු සිතුවේ කොහොමද මෙහෙම වුණේ මං සීනුව තිබ්බේ 7.00 නේද කියා කල්පනා කළා. "මගේ අත් වැරැද්දක් වෙන්න ඇති, දැන් ඉතින් වෙලා ගිය නිසා තාත්තාගෙන් බැනුම් අහන්න වෙයි" කියලා රාමු සිතුවා.



ඉක්මණින් සූදානම් වූ රාමු තම පියා සොයා ගියා. එදා රෑත් රාමු වේලාව උදේ 7.00 ට සීනුව තබා නින්දට ගියා. නමුත් එදිනත් සීනු ඔරලෝසුව රාමු නිදාගත් පසු වේලාව උදේ 8.00 ට වෙනස් කර ගත්තා. රාමු ඊළඟ උදයේ නැගිට්ටේ හරි පුදුමයකින් සීනුව නාද වී තිබුණේ උදේ 8.00 ටයි.

තාත්තා පැමිණ කීවේ “ රාමු ඉක්මණට ලෑස්ති වෙන්න, අදත් ඔයා පරක්කුයි“ යන්නයි.

හොඳයි අද රෑ බලමුකෝ මොකද වෙන්නේ කියලා සිතූ රාමු පිටත් වුණා. එදත් රෑ සීනු ඔරලෝසුව උදේ 7.00 ට තැබූ රාමු තම කාමරයේ තිබූ පුටුව මත හිඳගෙන අවදිව සිටියා.

“හොඳයි, අද බලමු කවුද මගේ ඔරලෝසුවේ සීනුව වෙනස් කරන්නේ කියා“ තනිවම කියා ගත්තා.

රාමු නිදාගන්නේ නැතුව හොරෙන් අවදිව සිටියා. රාමු නිදි බව සිතූ සීනු ඔරලෝසුව තම වේලාව උදේ 8.00 ට වෙනස් කර ගත්තා.

ඔරලෝසුවෙන් ආව ශබ්දයෙන් ඒ දෙස බැලූ රාමු දුටුවේ ඔරලෝසුව තමා විසින්ම වේලාව වෙනස් කර ගන්නා බවයි. පහුවදා උදේ 8.00 ට අවදි වූ රාමු සිතුවේ ඉන්න මම හොඳ වැඩක් කරන්න කියා හඬ නඟා ඔරලෝසුවට ඇසෙන්නට මෙලෙස පැවසුවා.

“අනේ මං අරගෙන තියෙන්නේ වැඩකට නැති ඔරලෝසුවක්නේ, තාත්තට කියලා ඔරලෝසුව කුණු

කූඩෙට විසික් කරනවා. එතකොට මේ ඔරලෝසුවට වෙන්නේ අර කුණු, දූවිලි ගොඩේ ඉන්නනේ“

ඒ ඇසුණු සීනු ඔරලෝසුව හොඳටම බය වුණා. අඬන්න පටන් ගත්තා.

“අනේ, රාමු එහෙම කරන්න එපා මට සමාවෙන්න ආයෙත් එහෙම කරන්නෑ මං, මං පොරොන්දු වෙනවා“

හෙට ඉඳලා ඔයාව හරි වේලාවටම ඇහැරවන්නම් කියා බැගෑපත් වුණා. රාමු හිනා වෙලා මෙහෙම කිව්වා. දැන්වත් ඔයා තේරුම් ගත්තද? ඔයා ඒ වගේම හොඳ යාළුවෙක් වෙන්න ඕනෙ කියලා රාමු කිව්වා. හරි කැමැත්තෙන් සීනු ඔරලෝසුව කැමති වුණා.

රාමු සීනු ඔරලෝසුවට නමක් දැම්මා "ටිං ටිං" කියලා. ඉතින් එදා ඉඳලා හැමදාම හැම දවසකම රාමු හරියට වේලාවට අවදි වුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN: 9 7-8-6242 -066-5
9 786242 066585